කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

මානවශාස්ත්‍ර පීඨය

# ප්‍රතිබිම්බ කලා - IMAT –E1025

## ව්‍යවහාරික ඡායාරූපකරණය

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි කාලය : පැය 03 යි

---

01. නිදහසට (1948) පෙර අවධියේ ලක්දිව ඡායාරූප ශිල්ප ව්‍යවහාරය සැකෙවින් විස්තර කරන්න.

02. ආලේඛ්‍ය ඡායාරූපකරණය (Portrait Photography) තෝරා ගන්නා ඡායාරූප ශිල්පියා විසින් සැළකිල්ලට ගත යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

03. වෙළඳ හා ප්‍රචාරක ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස ඡායාරූප ශිල්පයේ සහ ශිල්පියාගේ දායකත්වය විමර්ශනය කරන්න.

04. පහත නම් සඳහන් ඡායාරූප ශිල්පීන් වඩාත් ප්‍රචලිතව ඇත්තේ ඡායාරූප ශිල්පයේ කවර ව්‍යවහාරික අංශ සඳහා දැයි සඳහන් කොට, ඔවුන්ගේ විශේෂ හැකියාවන් හා දක්ෂතා සැකෙවින් දක්වන්න..

    i) යූසුෆ් කාෂ්
    ii) ඇන්සල් ඇඩම්ස්
    iii) දයාන් විතාරණ
    iv) බර්ටි ගුණසේකර

05. "පාරිසරික ඡායාරූපකරණය මගින් සමස්ත ජන සමාජයටම විශාල යහපතක් ඉටු කළ හැකිය." මෙම අදහස නිදර්ශන සහිතව තහවුරු කරන්න.

06. ඡායාරූප පුවත්පත් කලාව (Photojournalism) හඳුන්වාදීමේ දී ඔබ අනුගමනය කරන්නේ කවර න්‍යායාත්මක පදනමක් දැයි පැහැදිලි කරන්න.

07. කෙටි සටහන් ලියන්න.

    අ) ප්‍රවෘත්ති ඡායාරූපකරණය
    ආ) මංගල ඡායාරූපකරණය
    ඇ) මෝස්තර ඡායාරූපකරණය
    ඈ) ඡායාරූප සංස්කරණය

08. පුරාවිද්‍යා සහ නූතන ඉදිකිරීම් ක්ෂේත්‍රවල දී ඡායාරූප ශිල්පියෙකුගේ කාර්යභාරය පැහැදිලි කොට, එම ක්ෂේත්‍රයේ නියැලෙන ඡායාරූප ශිල්පියෙකු සතුව තිබිය යුතු තාක්ෂණික පරිචය කෙබඳු දැයි විමසන්න.

************************